කුරුණෑගල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශුද්ධ වත්කම් වල අඩුවීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල තත්ත්වය රු.124,517,730ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු.125,001,076 ක් වීමෙන් ශුද්ධ වත්කම්වල රු.483,346 ක අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවල වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 656,928 ක් වූ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් දායක මුදල් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂ වෙනුවෙන් ගෙවන ලද රු. 498,500 ක් වූ විදේශ ගමන් වියදම් පෙර ගෙවීම් වශයෙන් සඳහන් නොකර වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදී මෝටර් රථ හා කරත්ත ගිණුමේ වටිනාකම වූ රු. 20,237,345 තුල 2012 වර්ෂයේ ඉවත් කරන ලද රු. 1,202,000 ක් වටිනා ජල බවුසරයක අගයද, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සභාවේ නොමැති රු. 347,146 ක් වටිනා කසල කරත්ත වටිනාකම ද ඇතුලත්ව තිබුණි.

#### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 02 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු .5,194,494 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 116,234,660 ක් විය. ඊට අදාල කාලවිශ්ලේෂණය ඉදිරිපත් නොවුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.96,534,857 ක් වූ අතර ඉන් දළ වශයෙන් සියයට 0.2 ලෙස රු. 204,133 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් වේ.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.6,978,928 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.6 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

රු.1,462,304 ක් වටිනා ඉකුත් තැන්පතු ශේෂ 192 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරයේ මුදල් රෙගුලාසි 570 හා 571 පරිදි කටයුතු කර නොතිබුණි

.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,591,467 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,825,052 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,233,585 ක පිරිහීමක් පැවතුණි.මෙකී ප්‍රතිඵලයට රු.63,762,000 ක් වූ ප්‍රාග්ධන ලැබීම් සහ රු.89,518,070ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.3,164,603 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.125,969,483 න් ආසන්න වශයෙන් සියයට 81.17 ක් ලෙස රු.102,253,709 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය.එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.63,762,000 න් ආසන්න වශයෙන් සියයට 99.4 ක් ලෙස රු.63,406,000 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.103,378,016 න් ආසන්න වශයෙන් සියයට 44.75 ක් ලෙස රු.46,267,908 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම විය. ඉන් ආසන්න වශයෙන් සියයට 74.25 ක් ලෙස රු.34,355,832 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.89,518,070 න් ආසන්න වශයෙන් සියයට 23.96 ක් ලෙස රු.21,449,361 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ඉතිරිය ආසන්න වශයෙන් සියයට 76.04 ක් වූ රු.68,068,709 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 වරිපනම් බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ ප්‍රධාන කාර්යාල බලප්‍රදේශයේ වරිපනම් බදු හිඟය රු.2,614,894 ක් වූ අතර වාර්ෂික බිල් කිරීම රු. 3,556,318 ක් වූයෙන් වරිපනම් බදු හිඟය බිල් කිරීම මත ආසන්න වශයෙන් සියයට 73.52 ක් පමණ විය. මෙම හිඟය 2015 ජූනි වන විට රු.1,738,280 දක්වා අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ වැල්ලව උප කාර්යාල බල ප්‍රදේශයට අදාලව වරිපනම් බදු හිඟ ශේෂය රු. 5,232,284 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම රු. 4,809,317ක් වූයෙන් වරිපනම් බදු හිඟය බිල් කිරීම් මත ආසන්න වශයෙන් සියයට 108.79 ක් පමණ විය.

2.3.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂය අවසානයේ වැල්ලව උප කාර්යාල බල ප්‍රදේශයට අදාලව අක්කර බදු හිඟ ශේෂය රු. 178,173 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම රු. 19,000 ක් පමණක් වූයෙන් අක්කර බදු හිඟය බිල් කිරීම මත ආසන්න වශයෙන් සියයට 938 පමණ විය.

2.3.3 බලපත්‍ර ගාස්තු

ප්‍රධාන කාර්යාල බලප්‍රදේශයට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟය රු.369,816ක්ද වැල්ලව උප කාර්යාල බල ප්‍රදේශයට අදාලව එකී හිඟය රු. 289,130 ක්ද වූ අතර එම හිඟයන් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (4) හා 152 (4) වගන්ති අනුව නඩු පැවරීමක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදුව නොතිබුණි.

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වටිනාකම රු.95,000 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

1999 වර්ෂයේදී පළාත් පාලන සේවක මහා සංගමයට සියයට 2.5 ක පොලිය මත ලබා දී තිබූ රු.100,000 ක ණය මුදල අදාල ගිවිසුම අනුව වසරකට පසුව පියවන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට අදාල ගිවිසුම් කාලය වසර 15 කට ආසන්නව තිබුණ ද ණය මුදල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

04 <u>ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය</u>

<u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛණය අනුව ප්‍රාග්ධන ආදායම යටතේ රු.83,500,000 ක් ඇස්තමේන්තු කලද අපේක්ෂිත ආයතනවලින් මුදල් නොලැබීම මත ඉන් ලබා වී තිබුණේ ආසන්න වශයෙන් සියයට 38 ක් ලෙස රු.31,885,679 ක් පමණි.

05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය